| |
|---|
| ***සිංහල භාෂාව හා සාහිත්‍ය තරග 2024 (කලාප)*** |

අපේක්ෂකයාගේ නම :- ........................................................................................

(මුලකුරු සමග නම)

පාසලේ නම :- ........................................................................................

පාසල් වර්ගය :- 200 ට අඩු / 201 - 500 / 501 ට වැඩි

කොට්ඨාසය :- ........................................................................................

කලාපය :- ........................................................................................

කාලය පැය 02

මුළු ලකුණු 100

## පද්‍ය නිර්මාණ හා අවබෝධය

12 /13 ශ්‍රේණිය

සැලකිය යුතුයි:

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත ය. පළමුවන කොටසේ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.දෙවන කොටසේ (අ) හෝ (ආ) කොටස්වලින් එකකට පිළිතුරු සපයන්න.

### I කොටස

පෙරදිග ප්‍රබුද්ධ සාහිත්‍ය විචාරයෙකු වන විශ්වනාථ පඬිවරයා කවිය නිර්වචනය කොට ඇත්තේ රසය ආත්මය කොට ගත් වැකියක් ලෙසිනි. කවියා තම අත්දැකීම් ගවේෂණයට යොමු කරන මඟ, කවිය ලෙස හඳුන්වා දෙන ක්‍රිස්ටෝපර් ෆ්‍රයි ''තමා ලද චමත්කාරය ගවේෂණය කිරීම පිණිස මිනිසා පරිහරණය කරනු ලබන භාෂාව කවිය'' යනුවෙන් හඳුන්වා ඇත. කවිය සඳහා අවිය, බස බවට තර්කයක් නැත.

සෙසු සාහිත්‍ය කරුවනට වඩා කවියාගේ නිර්මාණයෙහි සම්පූර්ණ සාර්ථක අසාර්ථක බව ඔහු විසින් උපයුක්ත භාෂාව මත රඳා පවතියි. එහෙත් කවිය සඳහා සුවිශේෂී භාෂාවක් නැත. ඒ සඳහා ඇත්තේ පවත්නා භාෂාව විශේෂ ආකාරයට යොදා ගැනීමේ දක්ෂතාවයයි. කවියා නිතර ම ව්‍යංගාර්ථ කෙරෙහි අවධානය යොමු කරයි. ව්‍යංගාර්ථය මතුකර ගැනීමට අපූර්ව පද සංඝටනයක යෙදෙමින් ඉන් ධ්වනිතාර්ථ මවන්නට සමත් වෙයි. වාග් චිත්‍රණය කරයි. සංකේතානුසාරීව අදහස් ප්‍රතිපෝෂණය කරයි. කවියට සුවිශේෂ වූ සාධු සම්මත පද මාලාවක් නැතත් අපූර්ව වචන හරඹයකින් බසෙහි ව්‍යංජන ශක්තියෙන් උපරිම ඵල නෙලා ගැනීමට කවියා උත්සුක වෙයි.

i. කවිය පිළිබඳ විශ්වනාථ පඬිවරයාගේ අදහස දක්වන්න.

........................................................................................................................

........................................................................................................................

ii. කවියා සිය අවිය බවට පත් කර ගන්නේ කුමක් ද?

........................................................................................................................

iii. කවියා භාෂා භාවිතයේ දී නිතර අවධානය යොමු කරන්නේ කුමක් පිළිබඳව ද?

........................................................................................................................

iv. අනෙකුත් සාහිත්‍ය කරුවන්ට වඩා කවියා වෙනස් වන්නේ ඇයි?

........................................................................................................................

........................................................................................................................

v. කවිය සඳහා සුවිශේෂී වූ භාෂාවක් තිබේ ද?

........................................................................................................................

(ලකුණු 20)

2. පහත සඳහන් පද්‍ය පන්තිය පිළිබඳ රසවින්දනයක් ලියන්න.
1.

අතින් දෙන කරල් තුඩ ගා    බුදින්නනේ
බිතක්කන ඉදන් නෙත් වට    යොමන්නේ
උදේ හවස් කල ගෙයි වට    ලගින්නනේ
තොපට ලොව පටුයි පොඩි ගේ    කුරුල්ලනේ

රුවට රුව සමයි තෙපි වී    කුරුල්ලනේ
අවට නුඹ ගැබේ සිට සිරි    බලන්නනේ
බිමට ඉද්ද සේ බැස හැල්    නෙලන්නනේ
ගැහැට කැට පහර විඳ දිවි    ගෙවන්නනේ

එකට පොදිය එක මල් රෑනක    සිරිය
හවස රිවි කිරණ විසිරෙන්නා    සරිය
කීං හඬ නගා ඉඟිලෙති පා    එඩිය
හීන් රතු තුඩේ රඳවා අඩු    වැඩිය

වාන් කෙතේ අස්වනු අඩුවා    සැබව
හීන් තුඩ ගසා සොරු ගත්තා    සැබව
ඒත් තරහ නැත වී කුරුලනි    අසව
රූන් සරින් මගෙ සිත යයි තෙපි    කැටුව

(ලකුණු 30)

## II කොටස

පහත දැක්වෙන (අ) කොටසින් එකක් හෝ (ආ) කොටසේ කොටස් දෙකෙන් එකක් හෝ තෝරා ගෙන පද්‍ය අටකට නොඅඩු වන සේ පද්‍ය පන්තියක් නිර්මාණය කරන්න. සුදුසු මාතෘකාවක් යොදන්න.

අ)

3). I. පැලේ පිළේ ඉපදුණු මට
රජවාසල හුරු කොයින් ද?
රජුන් ඇමතියන් නලවන
මිහිරි මුසා බස් කොයින් ද?

II. ගල්වා හිසෙහි තෙල් යහමින්
එල්ලා කරෙහි පංචා යුධය
අල්ලාගෙන අතින් මා පාසලට එක්ක ගිය
අකුරු නුගත් අම්මා ඔබ ය

III. සිවියෙන් මිදුනු බෝවිටියා ගෙඩිය    සොයා
මල් කැකුළකට නෑකම් ඇති තුඩග    තියා
ලස්සන කිරිල්ලියක් වන ලැහැබැකට    ගියා
දිටියෙම් ඇගේ කූඩුව කොතනක ද    කියා

ආ) 4).

I. හේම මාලා සහ දන්ත කුමරු දළදාව රැගෙන ලක් දිවට පැමිණි අවස්ථාව පිළිබඳ පද්‍ය පන්තියක් නිර්මාණයක් කරන්න.

නැතහොත්

II. ඔබ ලැබූ ඕනෑම අත්දැකීමක් පද්‍යයකට නගන්න.

5). පහත දැක්වෙන කවි පද වලට අදාළ විරිතෙන්ම පිළිතුරු ලියන්න.

I. කන්ථක අසුගේ ළය පැලිලා මැරුණා විට

හිමියනි, දුකක් දැනුණාදෝ ඔබේ සිතට

.......................................................................................................................................

.......................................................................................................................................

II. පුද බිමට පෝ දිනට ජන ගඟක් ගලන්නේ

ඔවුන් ළඟ යදින්නට කවුද නුඹ එවන්නේ

.......................................................................................................................................

.......................................................................................................................................

III. දිනිඳු වගේ නුඹගේ ලොවට - එළිය ගෙනෙන පියා

මතු සසරේ අම්මා මෙන් - බුදු නොවේ ද පියා

.......................................................................................................................................

.......................................................................................................................................

IV. ගනඳුර දුරු කරලන්නේ - ලොවට එළිය බෙදමින්නේ

සිනහ වෙවී නුබ ඉන්නේ - මෘදු කරුණා පතුරන්නේ

.......................................................................................................................................

.......................................................................................................................................

(ලකුණු 50)